Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2018

8 ශ්‍රේණිය **සිංහල භාෂාව හා සාහිත්‍යය** කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

## I - කොටස

සැලකිය යුතුයි

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01 නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පමණක් අඩංගු පද පේළිය තෝරා යටින් ඉරක් අඳින්න.

(i) පරිගණකය, ලක්ශන, දූශන (ii) ත්‍යාග ප්‍රදානය, කනිෂ්ඨ, වීරෝදාර

(iii) කෘතීම, විශිෂ්ට, නිශ්පාදන (iv) නිෂ්ඵල, අක්ෂිධාන, ඡන්දය

02 නාම පද දෙකක් හෝ කිහිපයක් එක්වීමෙන් සෑදෙන නාම පද වර්ගය තෝරා යටින් ඉරක් අඳින්න.

(i) නාම නාම (ii) තද්ධිත නාම (iii) සමාස නාම (iv) කෘදන්ත නාම

03 සිංහල අක්ෂර මාලාවේ ව්‍යඤ්ජන අක්ෂර ගණන නිවැරදි ව දක්වා ඇති පිළිතුර යටින් ඉරක් අඳින්න.

(i) 48 යි (ii) 18 යි (iii) 32 යි (iv) 42 යි

04 ''මා කීව අසා තැති නොගෙන නිසලව හිඳිනු මැන සොඳුර. මොවුහු මේ වනයේ වැද්දෝ වෙති....'' මෙහි ඉරි ඇඳි පදය අයත් ව්‍යාකරණ රීතිය දක්වෙන වරණය තෝරා යටින් ඉරක් අඳින්න.

(i) විධි ක්‍රියා (ii) පූර්ව ක්‍රියා (iii) අසම්භාව්‍ය ක්‍රියා (iv) මිශ්‍ර ක්‍රියා

05 බහ්වර්ථ පද පමණක් ඇති පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(i) කුසුම, පුෂ්පය, මල, කමල (ii) දිය, ජය, ලෝකය, දෙන්න

(iii) වත, විස්තරය, උතුම්, වස්ත්‍ර (iv) දද, දැඩි, අඥාන, පක්ෂි

- **අංක 06 සිට 10 දක්වා දී ඇති ප්‍රශ්නවල හිස්තැනට සුදුසු නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් සම්පූර්ණ කරන්න.**

06 සුවඳරත්න කෙසෙල් ............................................... (පැළ / පැල) වලට පොහොර දමා පස් බුරුල් කළේය.

07 පළමු වාර විභාගයේ ........................................... (ප්‍රතිපල / ප්‍රතිඵල) ඇසූ අම්මා නංගීට හොඳටම දෙහි කැපුවා ය.

08 නුඹලා දුකින් ........................................................................ (මිදෙත්වා ! / මිදෙහුවා !)

09 සියලු සතුරෝ මිතුරෝ .......................................................... (වේවා ! / වෙත්වා !)

10 මව්වරු ............................................................................. (දරුවෝ / දරුවන්) පෝෂණය කරති.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

11 පහත සඳහන් පද සඳහා සමානාර්ථ පදය බැගින් ලියන්න.

(i) චතුර ........................ (ii) කනක ........................

12 පහත සඳහන් පද සඳහා විරුද්ධාර්ථ පදය බැගින් ලියන්න.

(i) ප්‍රවීණ ........................ (ii) උත්තම ........................

13 පහත සඳහන් බහුවචන පද සඳහා එක් පදය බැගින් ලියන්න.

(i) දළ ........................ (ii) සත් ........................

14 පහත සඳහන් පද දෙකෙහි අර්ථ ලියන්න.

(i) පාදපරිචාරිකා ........................

(ii) ජන්මෝත්සවය ........................

15 පහත සඳහන් පද සඳහා තනි පදය බැගින් ලියන්න.

(i) එකම කාලයට අයත් ........................

(ii) රාත්‍රියෙහි හැසිරෙන ........................

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවල දී ඇති ඉඟිවැකිවල අරුත් නිවැරදිව දක්වා ඇති පිළිතුරු වරහන් තුළින් තෝරා වගුව සම්පූර්ණ කරන්න.**

(හොඳටම බය වුණා / ආදායම් මාර්ගය නැති කළා / වැරදි අවබෝධයකින් සිටීම / දරුවකුගේ අකීකරුකම / අවසාන උත්සාහයත් ගැනීම / බොරු සෙනෙහසක් පෙන්වීම / නිෂ්ඵල ක්‍රියාවක යෙදීම / බලය පිරිහී ගොස් / දැඩි සතුටක් ඇතිවිය / බොරු කියමින් මවා පෑම)

| | | | |
|---|---|---|---|
| 16 | (i) | අන්තිම ඉත්තත් ඇදීම | ........................ |
| | (ii) | කුනිස්සන්ට දැල් දානවා | ........................ |
| 17 | (i) | තරු පෙණුනා | ........................ |
| | (ii) | හිසේ මලක් පිපුණා | ........................ |
| 18 | (i) | බඩට ගැහුවා | ........................ |
| | (ii) | අමු කැවිලා | ........................ |
| 19 | (i) | බක තපස් රැකීම | ........................ |
| | (ii) | එකා යකා වෙලා | ........................ |
| 20 | (i) | කිඹුල් කඳුල් හෙළීම | ........................ |
| | (ii) | පොරකටු ගෙවිලා | ........................ |

(ලකුණු 2 x 20 = 40)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**8 ශ්‍රේණිය** **සිංහල භාෂාව හා සාහිත්‍යය - II කොටස**

- **පළමු, දෙවන හා තෙවන ප්‍රශ්න ඇතුළු ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01 පහත සඳහන් ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.

(i) සාම්ප්‍රදායික යෙදුම් වර්ග දෙකක් නම් කරන්න.

(ii) ඉන්දියානු අනන්‍යතාවයේ සංකේතය වශයෙන් හඳුන්වන පුද්ගලයා කවුද?

(iii) සිංහල භාෂාවේ යෙදුණු වචනයක අරුත දැනගැනීමට උපකාරිවන ශබ්දකෝෂය කුමක් ද?

(iv) ටිබෙට් ජාතික එස් මහින්ද හිමි විසින් රචනා කරන ලද දේශාභිමානී පද්‍ය නිර්මාණ දෙකක් නම් කරන්න.

(v) පුවක් පතේ හෝ කුණු පත්කඩේ හෝ
කෙසෙල් කොළේ හෝ දමමින් සිඟා ලත්
ඉඳුල් බතක් සෙම් සොටු හා කෙළත් ලා
අනා බිදීමෙන් කිසිවෙක් රකිත් දිවි

ඉහත සඳහන් කවියෙහි රචකයා කවුද? (ලකුණු 2 x 5 = 10)

02 පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරාගෙන වචන 150 කට නො අඩු රචනාවක් ලියන්න.

(i) සිංහල දෙමළ අලුත් අවුරුදු සිරිත් විරිත්

(ii) මත් උවදුර පිටුදකිමු

(iii) ස්වභාව සෞන්දර්ය සුරකිමු

(iv) මරු කැඳවන රිය අනතුරු

(v) නිරෝගීමත් දිවියක් සඳහා ආහාර (ලකුණු 20)

03 ඔබේ පන්ති කාමරයේ බිත්ති පුවත්පතෙහි පල කිරීම සඳහා ''පොලිතින් වෙනුවට භාවිත කළ හැකි විකල්ප'' යන මාතෘකාව යටතේ දැන්වීම් පත්‍රිකාවක් සකස් කරන්න. (ලකුණු 10)

04 පහත සඳහන් කෘදන්ත නාම පද හා තද්ධිත නාම පද යොදා වාක්‍යය බැගින් නිර්මාණය කරන්න.

| | | | |
|---|---|---|---|
| (i) | නරඹන්නා | (vi) | රජතමය |
| (ii) | වචන්නෝ | (vii) | ලෝහමය |
| (iii) | හිඟන්නා | (viii) | බුද්ධිමත් |
| (iv) | සන්නාලියා | (ix) | පියාණෝ |
| (v) | දක්ෂතා | (x) | වචන්නෝ |

(ලකුණු 10)

05 (i) පහත සඳහන් පදවල නාමය (ප්‍රකෘතිය) හා ප්‍රත්‍යය වෙන් කොට ලියන්න.

1. ගැමි  2. සාමාජික

(ii) පහත සඳහන් නාම පදවලට සුදුසු විශේෂණ පද යොදා අර්ථවත් වාක්‍ය දෙකක් නිර්මාණය කරන්න.

1. අශ්වයා  2. මගියා

(iii) පහත සඳහන් ක්‍රියාපදවලට විශේෂණ පද යොදා අර්ථවත් වාක්‍ය දෙකක් නිර්මාණය කරන්න.

1. දුවයි  2. ගියේය

(iv) ස්ත්‍රී ලිංග, අතීත කාල, ඒක වචන වාක්‍ය දෙකක් නිර්මාණය කරන්න.

(v) පහත සඳහන් ක්‍රියා පද යොදා වාක්‍ය නිර්මාණය කරන්න.

1. වෙත්වා  2. කියනු මැන (ලකුණු 2 x 5 = 10)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

06 පහත සඳහන් ප්‍රකාශ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ) ''කාටවත් මොකවත් වුණොත් දැනගන්නේ කොහොමද?"

(i) පාඩමේ නම කුමක් ද? (ii) මෙය කිවේ කවුද?

(iii) මෙය කීවේ කාහටද? (iv) කුමන අවස්ථාවකදී කියන ලද්දක්ද?

(ආ) ''මගේ ගායනය වඩා මිහිරි වන්නේ මේ සුන්දර හරිත වන පෙත තුළයි.''

(i) පාඩමේ නම කුමක් ද? (ii) මෙය කිවේ කවුද?

(iii) මෙය කීවේ කාහටද? (iv) කුමන අවස්ථාවකදී කියන ලද්දක්ද?

(ඇ) ''මේක හරි බර සාර හින්ද දෙන්නෙක් දෙන්නෙක් එක්ක මාරුවෙන් මාරුවට කරගහගෙන ගෙනිහින් තියෙනවා.''

(i) පාඩමේ නම කුමක් ද? (ii) මෙය කිවේ කවුද?

(iii) මෙය කීවේ කාහටද? (iv) කුමන අවස්ථාවකදී කියන ලද්දක්ද?

(ඈ) '' ඉඳා; ඉක්මනට කඩයට ගිහිල්ලා නූල් රෝද දෙකක් අරගෙන වරෙන්''

(i) පාඩමේ නම කුමක් ද? (ii) මෙය කිවේ කවුද?

(iii) මෙය කීවේ කාහටද? (iv) කුමන අවස්ථාවකදී කියන ලද්දක්ද?

(ඉ) ''අනික පොත්පත්වල තියෙන හැම දෙයක් ම ඇත්ත විය නොහැකියි...''

(i) පාඩමේ නම කුමක් ද? (ii) මෙය කිවේ කවුද?

(iii) මෙය කීවේ කාහටද? (iv) කුමන අවස්ථාවකදී කියන ලද්දක්ද?

(ලකුණු 2 x 5 = 10)

07 පහත සඳහන් ගීතය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

රුක්අත්තන මල මුදුනේ
බඹරු නටන හැන්දෑවේ
සැඳෑ අඳුර පියමංකර
කවුරුද එන්නේ ....
පුතුනි බලන් යොමා නුවන්
කවුරුද එන්නේ ....

මුතු පිනි දල් සැලෙන උදේ
උදා දිමුතු හිරු එළියේ
පුතු සවනට රහස් කියා
පියමං කරලා
අප වෙනුවෙන් දවස ගෙවා
වෙහෙසී එන්නේ

පතොක් වැටිය උඩින් ඇදී
දිවයුරු මිය යන මොහොතේ
පුරා හඳක් සේ ඇතින්
කවුරුද එන්නේ
පුතුනි බලන් යොමා නුවන්
කවුරුද එන්නේ

ගේය පද : මහින්ද අල්ගම
ගායනය : විශාරද නන්දා මාලනී

(i) මෙම ගීතයෙන් කියවෙන්නේ කවුරුන් ගැනද?

(ii) මෙහි සඳහන් වන උපමාවක් ලියන්න.

(iii) මෙහි සඳහන් පුද්ගලයා උදෑසනම නිවසින් පිටවන බව හැඟවෙන ගීත කොටස සඳහන් කරන්න.

(iv) පතොක් වැටිය උඩින් ඇදීයන්නේ කුමක්ද?

(v) පහත සඳහන් පද සඳහා සමානාර්ථ පදය බැගින් ගීතයෙන් තෝරා ලියන්න.

1. පුෂ්පය
2. කණ
3. සූර්යයා
4. ඇස්

(ලකුණු 2 x 5 = 10)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



## පිළිතුරු පත්‍රය - I කොටස

(01) ii (02) iii (03) iv (04) i (05) ii (06) පැළ (07) ප්‍රතිඵල

(08) මිදෙහුවා ! (09) වෙත්වා ! (10) දරුවන්

(11) i. දක්ෂ, බුහුටි, සමත්, හපන් ii. රත්තරං, රන්, ස්වර්ණ

(12) i. ආධුනික ii. අධම

(13) i. දන්ත, ආසන්න, ජායාව ii. හත, යහපත්, ඡත්‍රය, සත්වයා, ශාස්ත්‍රය

(14) i. භාර්යාව ii. උපන්දින උත්සවය

(15) i. සමකාලීන ii. නිශාචර

(16) i. අවසාන උත්සාහයත් ගැනීම ii. නිෂ්ඵල ක්‍රියාවක යෙදීම

(17) i. හොඳටම බයවුණා ii. දැඩි සතුටක් ඇති විය

(18) i. ආදායම් මාර්ගය නැති කළා ii. වැරදි අවබෝධයකින් සිටීම

(19) i. බොරු කියමින් මවා පෑම ii. දරුවකුගේ අකීකරුකම

(20) i. බොරු සෙනෙහසක් පෙන්වීම ii. බලය පිරිහී (ලකුණු 2 x 20 = 40)

## II කොටස

01. (i) රූඩී (ඉඟිවැකි), ප්‍රස්තාව පිරුළු, යුගල පද, ආප්තෝපදේශ
    (ii) රබීන්ද්‍රනාත් තාගෝර් තුමා
    (iii) සුමංගල ශබ්දකෝෂය
    (iv) ලංකා මාතා, නිදහසේ මන්ත්‍රය, නිදහසේ දැහැන, දරු නැළවිල්ල හෙවත් ජාතික තොටිල්ල
    (v) ඵ. තෙන්නකෝන් (ලකුණු 2 x 5 = 10)

02 සුදුසු පරිදි ලකුණු ලබාදෙන්න. (ලකුණු 20)

03 සුදුසු පරිදි ලකුණු ලබාදෙන්න. (ලකුණු 10)

04 සුදුසු පරිදි ලකුණු ලබාදෙන්න. (ලකුණු 10)

05 (i) 1. ගම් + ඉ 2. සමාජ + ඉක
   (ii) සුදුසු පරිදි ලකුණු ලබාදෙන්න.
   (iii) සුදුසු පරිදි ලකුණු ලබාදෙන්න.
   (iv) සුදුසු පරිදි ලකුණු ලබාදෙන්න.
   (v) සුදුසු පරිදි ලකුණු ලබාදෙන්න. (ලකුණු 2 x 5 = 10)

06 (අ) (i) අවුරුදු සිහිනය (ii) පියසේන (iii) කුස්සි අම්මාට
   (iv) පියසේන අම්මා එනතුරු බලා සිට කුස්සි අම්මාගෙන් ප්‍රශ්න කළ අවස්ථාව
   (ආ) (i) සැබෑ ළෙන්ගතුකම (ii) පුංචි කිරිල්ලිය (iii) දූරිය ඇතුළු පිරිසට
   (iv) පුංචි කිරිල්ලියගේ මිහිරි නාදය අධිරාජ්‍යයා ඉදිරියේ ගායනය කරන්නට කියූ විට කිරිල්ලිය පිළිතුරු දුන් අවස්ථාව
   (ඇ) (i) එතනහාමි (ii) සාස්තරකාරයා (iii) ඩිංගිරාළට
   (iv) සාස්තරකරු සාස්තරය කියන අවස්ථාව
   (ඈ) (i) අවුරුදු සිහිනය (ii) ස්වාමි දුව (iii) පියසේනට
   (iv) පියසේන නුල් ගේන්න කඩයට යවන අවස්ථාව
   (ඉ) (i) සැබෑ ළෙන්ගතුකම (ii) යුවරජ ඇතුළු පිරිස (iii) අධිරාජ්‍යයාට
   (iv) අධිරාජ්‍යයා පොත්පත්වල සින්දු කියන කිරිල්ලියක් ගැන තොරතුරු ඇති බව කිය අවස්ථාව
   (ලකුණු 2 x 5 = 10)

07 (i) පියා ගැන (ii) පුරා හඳක් සේ
   (iii) මුතු පිනි දූල් සැලෙන උදේ / උදා දිමුතු හිරු එළියේ / පුතු සවනට රහස් කියා පියමං කරලා
   (iv) දිවයුරු
   (v) 1. මල 2. සවන් 3. හිරු 4. නුවන් (ලකුණු 2 x 5 = 10)